ප්‍රවෘත්ති නිවේදනය
PRESS RELEASE
සෞඛ්‍ය අමාත්‍යාංශය | சுகாதார அமைச்சு | Ministry of Health
Telephone Office: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

2021.02.23

ප්‍රධාන කර්තෘ පුවත්පත්,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ - රූපවාහිනී / ගුවන්විදුලි
සංස්කාරක වෙබ් පුවත්,

**<u>පවතින කොවිඩ් වසංගත තත්ත්වය සහ වෛරසය මර්දන වැඩපිළිවලෙහි ප්‍රගතිය පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යවරිය සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරින් අතර විශේෂ සාකච්ඡාවක්.</u>**

කොවිඩ් වෛරසය ආසාදිතව ප්‍රතිකාර ලබාගැනීමෙන් පසු පූර්ණ සුවය ලැබූ සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය අද දින (23) සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරින් සමග පවතින කොවිඩ් වසංගත තත්ත්වය සහ වෛරසය මර්දන වැඩපිළිවෙලෙහි ප්‍රගතිය මෙන්ම ඉදිරි සෞඛ්‍ය සංවර්ධන වැඩපිළිවෙල පිළිබඳව විශේෂ සාකච්ඡාවක් පවත්වන ලදි.

කොවිඩ් වෛරසය පාලනය හා මැඩපැවැත්වීම මූලික කරගනිමින්, පසුගිය කාලය තුල ක්‍රියාත්මක කළ එන්නත්කරණ වැඩපිළිවෙල, පී.සී.ආර් පරීක්ෂණ කටයුතුවල වත්මන් තත්ත්වය, සෞඛ්‍ය මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම, කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානවල වත්මන් තත්ත්වය පිළිබඳව ද මෙහිදී සෞඛ්‍ය අමාත්‍යතුමිය අවධානය යොමු කරන ලදි.

මෙම සාකච්ඡාවට එක්වෙමින් සෞඛ්‍ය අමාත්‍යතුමිය කියා සිටියේ තමන්ට කොවිඩ් වෛරසය ආසාදනය වී ප්‍රතිකාර ලබන කාලය තුල ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් සෞඛ්‍ය කාර්ය මණ්ඩල විසින් විවිධ ආගමික වැඩසටහන් සංවිධානය කර තිබූ බවත්, එලෙස ආශිර්වාද පුද පූජා පවත්වමින් ශක්තිය ලබාදුන් සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ඇතුලු සියළු දෙනාට සිය ස්තූතිය පුද කරන බවයි.

කොවිඩ් වසංගතයේ ආරම්භයේ සිට සෞඛ්‍ය අමාත්‍යාංශයේ සියළු කාර්ය මණ්ඩලය සහෝදරත්වයෙන්, එකමුතුව එක පවුලක අය මෙන් කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ගැටළුකාරි තත්ත්වයන්ගෙන් තොරව කොවිඩ් මර්දන වැඩපිළිවෙල ඉදිරියට ගෙනඒමට හැකි වූ බවත්, ඉදිරියටත් එම වැඩපිළිවෙල එලෙසින්ම ශක්තිමත් අයුරින් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම ද මෙහිදී පෙන්වා දෙන ලදි.

මෙම සාකච්ඡාව සඳහා සෞඛ්‍ය ලේකම් මේජර් ජනරාල් වෛද්‍ය සංජීව මුණසිංහ මහතා සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා ඇතුලු සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරු, අධ්‍යක්ෂ ජනරාල්වරු, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු ඇතුලු නිලධාරීන් රැසක් එක්ව සිටියහ.

විරාජ් අබේසිංහ
(මාධ්‍ය ලේකම්)
සෞඛ්‍ය අමාත්‍යාංශය